# සාමයේ සිහිනය



එම්.සී.බෙනට් වික්‍රමරත්න
රාගම ශ්‍රී ලංකා

රෑ කෑමෙන් පසු මධ්‍යම රාත්‍රී නත්තල් පූජාවට යාමට බලාපොරොත්තුවෙන් මම යහනේ වැතිර කල්පනා කර සිටියෙමි. තෙවන වරටත් සිනු හඬ ප්‍රදේශය පුරා පැතිරෙත්ම මා බිරිඳත් පුතුන් තිදෙනාත් කැටුව දෙව් මැඳුරට ඇතුළු වූ අතර බිරිඳ පඬුරු පාර්සලයද තුරුළු කරගෙන ප්‍රමෝදයකින් යුතුව දෙවුමැදුර තුළ අසුනක් සොයමින් ඉදිරියට ගියාය. මධ්‍යම රාත්‍රි නත්තල් පූජාවට තවමත් සෙනග ඇදෙමින් පැවතුනි. නොයෙකුත් වර්ණවත් අගනා ඇදුම් විලාසිතා සමග කොණ්ඩා මෝස්තර වලින් පිරි ප්‍රදර්ශන කුටියක් ලෙස මට දෙව් මැදුර තුළ දිස්විය. අප මේ එක් වන්නේ දිවි පුදා පවිටු ලෝ වැසියන් මුදාලන්නට දෙවියන් විසින් මෙලොවට බිහිකරවු සාමයේ දුගී කුමරුවන්ගේ ජන්ම දිනය සමරන්න දැයි මගේ සිත විමසයි. විටින් විට ප්‍රදේශය පුරා සතුට උතුරන රතිඤ්ඤා හඬද පැතිරුණි. කාගෙත් වන පුරා සිනාමුසු ප්‍රීතියෙන් උද්දාමවී තිබිණි. විදුලි එළියෙන් දෙව් මැදුරේ බිත්ති පුරා "තමාට මෙන් අසල් වැසියාටද ප්‍රේම කරන්න" සාමයේ කුමරුනි අපට සාමය දෙන්න. "සාමයේ කුමරුනි අපගේ නිවසට වඩින්න" වැනි යැදුම් සහිත බැනර් වෙත නෙත්සිත් යොමුවන්නේ කීදෙනාගේද? ඒ අතරින් "සාමය ඇති තැන සතුට එතැනය," මගේ සිත අවදි කළ යැදුමයි.

මගේ බිරිද ආසනයක් සොයා සෙනග අතරින් යද්දී නොදැනුවත්ව මගේ සොයුරිය සිටි බංකුව වෙත යාමෙන් කැළඹුන බිරිද මා දෙස තියුණු රහස් සංඥාවක් පා ආපසු පසුපෙලේ බැංකුවකට ගොස් අසුන් ගත්තාය. වසර ගණනක් ගත වූවද කෙතෙකුත් නත්තල් පසු කළද ඇය තුළ තවමත් වෛරය මුසු අමනාපය පිළිලයක්සේ පවතින හැටි මට සිහිවන විට, ඒව දුන් තහනම් ගෙඩිය කෑ ආදම් මෙන් මාද මා පිය වෛරයට ලක් වූවා නොවේදැයි අතීතය කරා මසිත දුවමින් මා හදවත වැළපෙනු දැනුනි.

සීනු හඬක් සමග පූජාසනය වෙත ඉතා සන්සුන් බැගැපත් ගමනින් පැමිණි පූජා ප්‍රසාදිතුමා ආරාධිත විශේෂ පියතුමකු බව පෙනුනි. පූජාසනය වටා ධාර්මික ගමනේ යෙදුන පියතුමක් තුළින් දිස්වූයේ ක්‍රිස්තු චරිතය ආකර්ශණීක ලෙස අප තුළත් සිහිග න්වමින් දැඩි බැතිසිතින් ශ්‍රාවකයන් දෙස බලා සිංහල හා දෙමළ බසින් "මෙම පූජා යාගය සඳහා ඔබ ගෙනා පඬුරු පූජාසනය ඉදිරිපිට පඩිපෙළ මත තබා අසුන් ගන්නැයි කළ ඉල්ලීමෙන් කාගෙත් විමතියක් සමග එයි ඉටු විය. මොහොතකින් උත්කෘෂ්ඨ මණ්ඩලයේ දෙවිඳුන්ට මහිමය වේවා" යි පියතුමා ගාම්භීර හඬින් ගායනය කරත්ම සීනු හඬින් ලොව අවදි කරද්දි අවට සිසාර විරාමයකින් තොරව රතිඤ්ඤා හඬින් සාමයේ කුමරුගේ උපත ලොවට ප්‍රකාශ වුනි. විශේෂතම දිනයක් වූවද පියතුමාගෙන් දේශනයක් නොතිබීම කාගෙත් කුතුහලයටත් විමතියටත් හේතුවිය.

පූජා යාගයට සැදැහැවතුන්ගේ පඬුරු ඔප්පු කිරීමේ අවස්ථාව එළඹෙද්දී පූජාසනය ඉදිරිපිට ගරාදි වැට ලගට ශාන්ත ගමනින් පැමිණි පියතුමා දෙඅත් වැළගෙන මෙසේ සභාව ඇමතීය.

"දරුවනී අපි ජේසු සමිදුන් දැකීමට සුදානම් වෙමු. එදා මේ මොහොතේ සුරදුතයෝ සුරලොව සුරිදුන්ටත් මිහිමත බිහි වූ සාමයේ කුමරුන්ටත් මහිමයත් ගෞරවයන් අත්වේවා" යි සාමයේ කුමරු ලොවට වැඩිය බව ප්‍රීති ඝෝෂා කළහ. නමුත් සහෝදර සහෝදරියනි, තවමත් අද අප අතර වෛරය, අසමගිය ඊර්ෂ්‍යාව රජකරනවා නොවේද? ඒවා දැන් සිහිපත් කරන්න"යි පවසක්ම විදුලි පහන් නිවී ඉටිපහපහන් එලිය පැතිරෙද්දි සැදැහැවතුන්ගේ නිහැඩියාව ජේසු බිළිදුන් බිහි වූ මොහොත සිහිපත් කරවිය.

සුළු වේලාවකට භක්තියෙන් යුතුව තම දෙනෙත් වසා ගත්තා ලෙස ඉල්ලා සිටි පියතුමා දැඩි දයාන්විත හඬින් "ජේසුනි අද ඔබ අපට සාමය ගෙනා දිනයයි. ඔබගේ නියෝජිතයා ලෙසින් පෙනී සිටින මා වෙතින් මේ ජනතාවට ඔබ වහන්සේ දකින්නට සලස් වනු මැනවි. මගේ දුෂ්‍යමාන මුවින් පිටවන වචන වලට ඔබගේ හඬ මුසුකොට ඔවුන්ගේ හදවක් අවදි කරත්ත ඔබේ හඬ මොවුන්ගේ දෙසවන් කරා යොමු කරමි". සැදැහැවතුන් දෙනෙත් වසාගෙන මෝහනයට පත්වූවාසේ ජේසු දකිනු ඇතැයි මට සිතුනි. ඒ දෝංකාර හඬින් "දරුවනි දැන් මා කරන අයැදුම බාල, තරුණ, වැඩිහිටි, මහලු සැම සිතින් අනුග මනය කරන්නැ" යි පැවසු පියතුමා "ජේසුනි ප්‍රේමයෙන් පිරි දෙවිදුන් අතින් දුවිල්ලෙන් මවනු ලැබු බව අමතක කොට මේ දක්වා ඔබට පිටු පෑවෙමි. මගේ මව්පියන්ට වෛර කළෙමි. බිරිදට වෛර කළෙමි. සැමියාට වෛර කළෙමි. දරුවන්ට වෛර කළෙමි. අඹු සැමි අප දෙදෙනාගේ මව්පියන්ට වෛර කළෙමු. අසල්වාසින්ගේ සුළු වරදට, දියුණුවට වෛර කොට සාමය කඩ කලෙමි. මේ වෛරයට හේතුව අවංකව ආදරය නොකිරීම, හිතුවක්කාර විවාහය, දායාදය , ඊර්ෂ්‍යාව, ආත්මාර්ථය හා දේපල තණ්හාව, රැකියා ස්ථානයේ සොයුරු සේවක සමග සුළු ප්‍රශ්ණ වලදී ඇති කරගත් ආරවුල්ද හා කුඩා අප පැන්සලට, පෑනට , පොතට පාසැලදී ඇති කරගත් අමනාපකම්ද බව සිහිපත් වේ. එකී අසමගියෙන් වෛරයෙන් මිදෙන්නට උත්සහ නොකොට තව තවත් ඒ දුර්ගුණ තුළ දිවි ගෙවමින් ඔබ වහන්සේට පිටු පෑවෙමි. නමුත් ස්වාමිනි ඔබ නොව මා රැවටුනා බව දැන් සිහිපත්වෙයි. මා ජිවිතයෙන් පරාජය වු බවට මගේ හදවත වැලපෙයි. පියතුමන්ගේ ගැඹුර හඬ නැවතත් වෙනස්වී දරුවනි මේ ඔබ අමතන්නේ මෙදින ඔබට සාමය ගෙන ආ ගැළවුම්කාර ජේසු සමිදුණෝ යයි පවසා යළි දැන් ඔබගේ දෙසවන් මා වෙත යොමු කරන්න, එද ාමා ඔබට දෙසු වාක්‍ය නැවත සිහිපත් කරමි. එනම් "ඔබේ පඩුරු ඔප්පු කරන්නට පෙර අමනාපවූ ඔබේ සොයුරා සමග සමාදානවී එන්න". පියතුමා එකී දේව වාක්‍ය ගැන මොහොතක් මෙනෙහි කොට දෙනෙත විවෘත කරන ලෙස සැමගෙන් ඉල්ලීය. එවිටම විදුලි බුබුලු දැල්විනි. "දැන් ඔබ හැම ජේසුගේ ඉල්ලීම අනුව ඔබට වෛරකාරයකු තරහාකාරයකු නොමැතිනම් පමණක් තම පඬුරු තිබු තැනින් ගෙන ඔප්පු කිරීමට මා වෙත භක්තියෙන් ගෙන එන්න. ජේසු ඔබ දෙස බලා සිටී" යනුවෙන් සිංහල හා දෙමළ බසින් පවසා හිස පහතට යොමා ගෙන සිටියේය.

බිරිඳ මා වෙත ආයාචනාත්මක බැල්මක් හෙලුවාය. විෂ්මිත අසරණ බවක් එහි ගැබ්වී තිබුණු. සෙමින් හිස දෙපසට වැනීමට මට සිදුවිය. මේ අතර කිසිදු බැතිමතකු පුජාසනය වෙත නොයන බවක් පෙණිනි. නමුත් බැනියමක් මතට දුගී බවේ පැරණි කළු කෝට් කබායකින් හා සුදු වේට්ටියකට හුරු සරමක් හැදි මැදවියේ මිනිසෙක් කුඩා බිලිදෙකු තුරුළු කොටගත් හැකිළුණු සාරියකින් ගත වසා ගත් කාන්තාවක් සමග කුඩා පාර්සලයක් දෝතින් ගෙන අප පසු කොට පූජාසනය වෙත ගොස් පියතුමා ඉදිරියේ මතක් භක්තියෙන් දණගසා දෝත් නමා වැද ගෙනා පඬුර පියතුමා අත තැබිය. වෙතත් කිසිදු පඬුරු පුජාසනය වෙත නොගෙනෙන බව වැටහුණු පියතුමා මෙම දුගී මනුෂ්‍යයා අමතා සොහොයුර ඔබට කිසිදු තරහකාරයෙක් නැද්ද? යි ඇසූ විට අනේ නෑ ස්වාමි. මම ටවුමේ පරණ සපත්තු මහනවා. ඉතින් මා ලගට එන හැමෝටම මම ආදරෙයි. ඉතින් කොහේද මට හතු රෝ. ඒ හැමෝම මගේ අසල් වැසියෝ මේ. මගේ සුමාන තුනක් වයස චුටි පුතයි, පවුලයි සමග සන්තෝෂයෙන් ඉන්නවා" යි බැගෑපත්ව හිස නමා පැවසීය. එවිටම පියතුමා දුගී ස්ත්‍රියගෙන් බිළිදා දෑතට ගෙන සෙනග වෙත ඔසවා ප්‍රබෝධමත් ගාම්භීර හඬින් මෙන්න අද ඔබගේ සාමයේ දූතයා "(කුමරා) යි පවසා පූජාසනය වෙත හැරී හිසනමා ආපසු බිළිදා ස්ත්‍රිය අත තබා" යන්න වාඩිවෙන්නැයි ඔවුන්ට පැවසීය. ටවුමේ පදික වේදිකාවේ සපත්තු මසන අන්තෝනියෝ වෙත කාගෙත් සානුකම්පිත දෙනෙත් යොමු විය.

අනතුරුව පියතුමා එම දුගී පවුල පූජා කළ කුඩා පඬුර අල්තාරය මත තබා, ඉදිරිපෙළ සිටි කුඩා දරුවන් ලවා අනෙක් පඬුරු තිබු තැන්වලින් පූජාසනය වෙත ගෙන්වාගෙන කිසිත් නොවුනා ලෙස පූජා මෙහෙය පැවැත්විය. සැදැහැවත්හුද ඉතා සන්සුන්ව දිව්‍ය පූජාව වෙත සිත් යොමු කළහ. පූජාව අවසානයේදී කුරුස ලකුණෙන් ආශිර්වාද කොට "ඔබ එකිනෙකා එකම පවුලක සහෝදරයන්සේ වැළඳ සාමය පතන්න. නමුත් එය ජුදාස් ජේසුස්ට සුභපතා වැළදගත්තාසේ නොව මරියතුමී තම ඥාති එළිසබෙත් තුමිය වැළඳ ගත්තාසේ නිර්ව්‍යාජ ප්‍රේමයෙන් වැළදගෙන සාමය පතන්න. ඔබ හැමට සදා සාමය වේවා" යි පියතුමාගේ නත්තල් පැතුම අවසාන සාමයේ නත්තල් ගීතය ගැයිනි.

පියතුමාගේ නත්තල් පූජාවේ පරමාර්ථය හා ගාම්භීරත්වය අගය කරමින් විශ්මිත වූ සෙනග දෙව් මැදුරෙන් පිටතට විත් ප්‍රීති ප්‍රමෝදයෙන් එකිනෙකා වැළඳ ගනිමින් සාමය පැතුහ. ඒ සෙනග තුලින් මගේ සොයුරියද බිරිද වෙතපැමිණියේය. එකවරම දෙදෙනාගේ දෑත් දෙපසට විහිදා වැළද ගත්හ. මගේ දෙනෙත් සතුටු කඳුලින් පිරී ගියාසේම බිරිදගේ දෙකපොල දිගේ කදුලු රූරා ඇද හැලෙන බව දුටිමි. වඩාත්ම ප්‍රමෝදයට පත් වූයේ මගේ දරු තිදෙනාය. මස්සිනාද සැමට සුභ පතමින් "නංගිලා මුළු පවුලටම අද රෑ කෑමට අපේ ගෙදර එන්නැයි" සතුට පිරි ආරාධනාව කරත්ම මගේ සොයුරිය "ඇත්තමයි නංගි මාත් මේ කියන්නට කට ගත්තා විතරයි, දැන් පරණ අතීතය අමතක කරලා අද රෑට හැමෝම එන්න" යි ආරාධනය තවත් ප්‍රබල කළාය. ජේසු බිළිදුගේ සාමය අද මෙහි හැම වෙත ලැබී ඇති සේය. මා බිරිදත් දරුවනුත් සමග නිවසට ඇතුළුවුනු විට මට දැනුනේ නව නිවසකපැමිණියාසේය. බිරිදටද එසේම දැනෙන්නට ඇතැයි සිතුනි.

එවිටම "කමල් නැගිටින්න, නැගිටින්න, පූජාවට යන්න ලෑස්තිවන්නැයි" බිරිද මගේ සිරුර තදින් සෙලවිමෙන් කෙටි නින්දද අවසන් වූයේ දුටු සිහිනයද අවසානය දකිමිනි. යහනින් නැගිට බිරිදගේ මුහුණ දෙස බලමින් එය අද සැබෑ වේවායි පැතුවෙමි.